# උත්ථාන සමයේ තුන්වන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි. ක්‍රියා 9 : 1–20

**"මොහු මාගේ නාමය විජාතීන් වෙත ගෙන යනු පිණිස මා තෝරා ගත් භාජනයකි."**

එකල සාවුල් තවදුරටත් ස්වාමින් වහන්සේගේ ගෝලයන් මරා දමනු පිණිස ඔවුන්ට විරුද්ධව තර්ජනය කරමින් සිටියේය. ඔහු උත්තම පූජකයා වෙත ගොස්, ඒ ඇදහිල්ලට අයත් පුරුෂයන් හෝ ස්ත්‍රීන් හෝ සම්භ වුනොත් ඔවුන් අල්ලා ජෙරසලමට ගෙන එනු පිණිස, දමස්කයේ ධර්මශාලාවට ඉදිරිපත් කිරීම සඳහා ඔහුගෙන් බලපත්‍රයක් ඉල්ලා ගත්තේය. මෙසේ ඔහු ගමන් කරමින් දමස්කයට ළංවූ කල, හදිස්සියෙන් අහසින් ආලෝකයක් ඔහු අවට බැබළිනි. ඔහු භ්‍රාන්ත වී බිම වැටුණේය. එවිට "සාවුල්, සාවුල්, ඔබ මට පීඩා කරන්නේ මන්ද?" යි කියන හඬක් ඔහුට ඇසිණි. "ස්වාමිනි, ඔබ කවරෙක්ද?" යි ඔහු ඇසීය. "මම ඔබ විසින් පීඩා කරනු ජේසුස් ය. නැගිට නුවරට ඇතුළුවන්න, ඔබ කළයුතු දේ ඔබට කියනු ලබන්නේය" යි ඒ හඬ පැවසීය. ඔහු මඟ ගමන් කළ මිනිසුන්ට ඒ හඬ ඇසුණු නමුත් ඔව්හු කිසිවකු නොදැක තුෂ්ණිම්භූතව සිටියේය. සාවුල් නැගිට ඇස් ඇරිය කල, ඔහුට කිසිවක් පෙණුනේ නැත. ඔව්හු ඔහු අතින් අල්ලා ගෙන දමස්කයට ගෙන ගියහ. ඔහු තුන් දිනක් ඇස් නොපෙනී නොකා නොබී සිටියේය.

දමස්කයෙහි අනනියස් නම් එක්තරා ගෝලයෙක් සිටියේය. ස්වාමින් වහන්සේ ඔහුට දර්ශනය වී, "අනනියස්" කියා ඔහු ඇමතූ සේක. "ස්වාමිනි, මම මෙහි ය" යි ඔහු කීය. ස්වාමින් වහන්සේ ඔහුට කථා කොට, "නැගිට කෙළින් වීදියට ගොස්, තාර්සස් හි වැසියෙකු වූ සාවුල් නම් කෙනෙකු ගැන ජූදස් ගේ ගෙදරින් විමසන්න. ඔහු යාච්ඤා කරමින් සිටී. තමාට පෙනීම ලැබෙන පිණිස අනනියස් නම් මිනිසෙකු පැමිණ තමා පිට අත් තබනු ඔහුට දර්ශනය වී ය" යි වදාළ සේක. එහෙත් අනනියස් උත්තර දෙමින්, "ස්වාමිනි, මේ මනුෂ්‍යයා ජෙරුසලමේදී ඔබගේ

ශුද්ධවරයන්ට කොපමණ හිංසා පීඩා කළේදැයි බොහෝ දෙනෙකුගෙන් ඇසීමි. මෙහිදීත් ඔබගේ නාමයට යාච්ඤා කරන සියල්ලන් අත්අඩංගුවට ගන්නට ඔහු නායක පූජකයන්ගෙන් බලය ලැබ සිටීය" යි කීය. එහෙත් ස්වාමීන් වහන්සේ ඔහුට කථා කොට "යන්න, මන්ද, ඔහු මාගේ නාමය විජාතීන් ද රජුන් ද ඊශ්‍රායෙල් පුත්‍රයන් ද වෙත ගෙන යාමට මා විසින් තෝරා ගත් භාජනයකි. ඔහු මාගේ නාමය නිසා කොපමණ දුක් විඳින්නට ඕනෑ ද කියා ඔහුට දක්වන්නෙමි" යි වදාළ සේක.

අනනියස් පිටත්ව ගොස් ගෙට ඇතුළුවී ඔහු පිට අත් තබා, "සහෝදර සාවුල්, ඔබට පෙනීම ලැබෙන පිණිස ද ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ කරනු ලබන පිණිස ද ස්වාමීන් වහන්සේ එනම්, ඔබ ගමන් කළ මාර්ගයෙහිදී ඔබට දර්ශනය වූ ජේසුස් වහන්සේ මා එවූ සේක" යි කීය. එකෙනෙහිම ඔහුගේ ඇස් වලින් කොරපොතු වැන්නක් වැටී ඔහු පෙනීම ලැබීය. ඔහු නැගිට බෞතීස්ම ස්නාපනය කරනු ලැබ කෑම කා යළිත් ශක්තිමත් විය.

සාවුල් දමස්කයේ ගෝලයන් සමඟ කීප දවසක් නතරව සිටියේය. ඔහු නොපමාව ජේසුස් වහන්සේ ගැන ධර්මශාලා වලදී දේශනා කරමින්, "උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා ය"යි ප්‍රකාශ කළේය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 117 : 1-2

පිළිතුර: මුළු ලෝ පුරා ගොස් සුබ අස්න පතළ කරන්න.

ගීය:

සකල ජාතිනී, සමිඳුන්ට ප්‍රශංසා කරන්න. සව් සතුනි, හිමිතුම ගුණ මහිමය වර්ණනා කරන්න.

මන්ද, අප කෙරෙහි සමිඳුන්ගේ ප්‍රේමය ඉමහත්ය.
එතුමන්ගේ විශ්වාසකම සදහටම පවත්නේය.
සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"උත්ථාන කරනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ යළිත් නොමැරෙන බව අපි දනිමු. මින්මතු මරණය උන්වහන්සේ කෙරෙහි බලපවත්වන්නේ නැත."
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 6 : 52–59

**"මාගේ මාංශය සැබෑ ආහාරයක් ද මාගේ රුධිරය සැබෑ පානයක් ද වේ."**

එවිට ජුදෙව්වරු ඔවුනොවුන් අතරේ විවාද කරමින්, " මේ මිනිසා ඔහුගේ මාංශය අනුභව කරන පිණිස අපට දෙන්නේ දැ" යි කීහ. එබැවින් ජේසුස් වහන්සේ ඔවුන් මෙසේ ඇමතූ සේක. " ඒකාන්තයෙන් මම ඔබට කියමි, ඔබ මනුෂ්‍ය පුත්‍රයාණන්ගේ මාංශය අනුභව නොකරන්නහු නම්, ඔහුගේ රුධිරය පානය නොකරනහු නම්, ඔබ තුළ ජීවනය නැත. යමෙක් මාගේ මාංශය අනුභව කරන්නේද, මාගේ රුධිරය පානය කරන්නේ ද ඔහුට සදාතන ජීවනය ඇත. තවද, මම ඔහු අන්තිම දවසේදී උත්ථාන කරන්නෙමි. මාගේ මාංශය සැබෑ භෝජනය වේ. මාගේ රුධිරය සැබෑ පානය වේ. මාගේ මාංශය අනුභව කරන, මාගේ රුධිරය පානය කරන තැනැත්තේ

මා තුළ ජීවත් වන්නේය, මම ද ඔහු තුළ ජීවත් වන්නෙමි. ජීවමාන පියාණන් වහන්සේ මා එවා වදාළ බැවින් මා පියාණන් වහන්සේ නිසා ජීවත් වන ලෙසම, මා අනුභව කරන තැනැත්තේ මා නිසා ජීවත් වෙයි. මේ වනාහි ස්වර්ගයෙන් පහළ වූ භෝජනය වේ. එය අපේ පියවරුන් වැළඳූ ආහාර මෙන් නොවේ. ඒ ආහාරය වැළඳූ ඔව්හු මළහ. එහෙත්, මේ භෝජනය වළඳන තැනැත්තේ සදහටම ජීවත් වන්නේය." උන්වහන්සේ කපර්ණාවුමේ ධර්මශාලාවෙහි උගන්වමින් සිටියදී මේ සියල්ල වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.